**2019/03/21 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**

2019/03/21 දින පෙ.ව. 11.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 6. කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 7. එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 8. ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 10. සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 11. නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 12. විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 13. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 14. එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 15. විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 16. කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 17. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 20. බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2019.03.21 දින විශේෂ මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා. අද දින විශේෂ සභා රැස්වීමක් සඳහා සහභාගී වූ ගරු උප සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, අදාල විශේෂ සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. අද දින විශේෂ මහ සභා රැස්වීමක් පැවැත්වීමට හේතු වුනේ පුරා අවුරුදු 05 ක අඛණ්ඩ සේවයක් කල අපේ ප්‍රාදේශීය සභා ලේකම්තුමිය වෙනත් ස්ථානයකට ස්ථාන මාරුවීම් ලැබ යන නිසා සභාවේ මූල්‍ය කටයුතු කිරීමේ , චෙක්පත් අත්සන් කිරීමේ දී නව ලේකම්තුමියගේ අත්සන සහතික කරවා ගැනීම සඳහා අද දින විශේෂ සභාව කැඳවූ අතර, මෙතැන් සිට එහි වැඩ කටයුතු ආරම්භ කරමු.

**සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

01. නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් දූරය හෙබ වූ එම්. එච්. ෆර්සියා ෆර්වින් මහත්මියගේ ස්ථාන මාරුවීම හේතුවෙන් නව ලේකම්ධූරයේ වැඩ භාර ගත් චන්ද්‍රිකා දයාවංශ මහත්මියට ප්‍රාදේශීය සභාවේ මූල්‍යා පරිපාලන කටයුතු භාර දීමටත්, චෙක්පත්වල පළමු අත්සන්කරු ලෙස චන්ද්‍රිකා දයාවංශ මහත්මිය නම් කිරීමටත් යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

02. නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍යා පරිපාලන කටයුතුවලදී සභාපති නාගොඩ ප්‍රාදේශීය සභාව නමින් ගිණුම් පවත්වාගෙන යාමට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**විශේෂ නිවේදන**

❖ ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමා විසින් අද දින සභාවට පැමිණීමට නොහැකිවීම සම්බන්ධයෙන් ෆැක්ස් පණිවිඩයක් එවා ඇත.

"ග්‍රාමීය කර්මාන්ත හා සමාජ සුබසාධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය 2019.03.21 වන අද දින පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිතව ඇත. එම නිසා දෙපාර්තමේන්තුවේ සියලුම සේවකයන්ගේ නිවාඩු අද දින අවලංගු කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇති බැවින් විශේෂ සභා වාරයට සහභාගී විය නොහැකි බව කණගාටුවෙන් දන්වා සිටිමි. නාගොඩ ප්‍රාදේශීය සභාවේ කීර්තිමත් ලේකම්වරියක් ලෙස සේවය කර අද දින ස්ථාන මාරු වී යන ලේකම්තුමියට නව තනතුරේ කටයුතු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරන අතර, අද දින වැඩ බාර ගන්නා නව ලේකම් තුමියට සුභාශිංෂණ පුදකරමි. අද දින සභා කටයුතු සාර්ථක වේවා යි ප්‍රාර්ථනා කරමි."

**වෙනත් කරුණු**

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ගරු උපසභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, අවසරයි පළමුවෙන්ම අද සභාව කැඳවීමට හේතු වුණේ, අපේ සභාවේ අවුරුදු 5 ක සේවයක් කරලා, වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු වී යන අපේ ලේකම්තුමිය වෙනුවෙන්, එතුමිය කරපු සේවාවන් වෙනුවෙන්, ප්‍රණාමය පුද කිරීම සඳහායි. විශේෂයෙන්ම මෙතුවක් කල් කරගෙන ආ මූල්‍යා ගනුදෙනු සඳහා අත්සන් කිරීමේ බලතල අලුත් ලේකම්තුමිය වෙත පැවරීමටත්, අලුත් ලේකම්තුමියගේ අත්සන සහතික කරගන්න අවශ්‍ය නිසාත් අද දින විශේෂ මහා සභාවක් කැඳවා නව ලේකම්තුමියගේ අත්සන සභා සම්මත කර, චෙක්පත් වල අත්සන් කිරීමේ නීතිමය බලතල පවරා ගැනීම තමයි. අද විශේෂ සභාව කැඳවීමට ප්‍රධාන හේතුව වුණේ.

අපි ලේකම්තුමිය ගැන කතාකරනවානම්, එතුමිය 2014 වර්ෂයේ නව ලේකම්තුමියක් හැටියට ප්‍රාදේශීය සභාවට එකපාරටම උඩින් පහත් කරලා දැම්ම වගේ දෙයක් සිද්ධ වුනේ. මොකද, ප්‍රාදේශීය සභා අණ පනත්, කෙටුම්පත් මොනවත් නොදැන මේ සභාවට ඇවිත්, අපේ හිටපු සභාපති හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා සහ අනිකුත් මන්ත්‍රීතුමන්ලා සමග සහයෝගයෙන් කටයුතු කළා. පසුව 2015 වර්ෂයේ දී අපේ සභා වාරය අවසන් වුනා. ඉන්පසු ප්‍රාදේශීය සභාවේ පරිපාලන නිලධාරී හැටියට ලේකම්තුමිය යටතේ තමයි ප්‍රාදේශීය සභාව පාලනය වුනේ. ප්‍රාදේශීය සභා පිළිබඳ, නීතිරීති, අණපනත්, ආදී දේ ගැන ලේකම්තුමිය ඒ වර්ෂ කිහිපය තුළ මේ ප්‍රාදේශීය සභාවේ සියලු කටයුතු නිසියාකාරව සිදු කළා. අපට වගේ එතුමියට ගොඩක් බලපෑම් ආවෙ නැහැ. මූල්‍ය කටයුතු නිසියාකාරව සිදු කරගෙන ගියා. ඒ වගේම එතුමිය මෙම ආයතනයේ නිලධාරීන් සමඟත්, හිටපු සභිකයින් සමඟත් සහයෝගයෙන් කටයුතු කරමින්, අපේ ප්‍රාදේශීය සභාව සතු සම්පත් ගැන සොයා බලලා, ඒවා ප්‍රාදේශීය සභාව යටතට පත්කර ගන්න මහන්සි වී කටයුතු කලා. මොකද ඔබතුමාල දන්නව ඇති. අපේ සභාවෙ කිව්වට, අපි භුක්ති වින්දට, සභාවේ කියලා නීතිමය ලෙස අයිතියක් නැති හුඟක් දේවල් තියෙනවා. විශේෂයෙන්ම ක්‍රීඩා පිටි, කඩවල් වගේ ගොඩක් දේවල් තියෙනවා. එතුමිය මේ කාලසීමාව තුළ නීතිමය තත්ත්වයන් උඩ එම සම්පත් අපේ සභාව සතු කරගන්න නීතිමය කටයුතු කරලා තිබුණා. අපිට ඒක ලොකු ශක්තියක්. ලේකම්තුමියගේ ස්ථාන මාරු වීමත් සමග මගේ ශක්තියත් අඩුවෙනවා. විශේෂයෙන්ම තල්ගස්වල, පොළ අසල ඉඩම්වල කටයුතු කරලා, ලිපිගොනු සකස් කරලා දීලා තියෙනවා. ඒ ගැන ඇත්තටම අපි ගරු කරන්න ඕන. ඒ වගේම සුමානෙකට සැරයක් ඇප්තොප්වත්තට, උප කාර්යාල වලට ඒ වගේම අපට සම්බන්ධ ආයතන වලට ගිහිල්ලා කටයුතු සොයා බලලා තියෙනවා. නමුත් අපට ඒ හැකියාව නැහැ. එතුමියගේ බලතල පාවිච්චි කරලා, ගොඩක් ප්‍රශ්න නිරාකරණය කරගෙන තියෙනවා. මේ අවස්ථාවේ සභාපති හැටියට සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් ගරුත්වය, ප්‍රණාමය පුද කරනවා.

ඒ වගේම එතුමිය ජාති බේද නැතුව අපේම සහෝදරයෙක් වගේ සහජීවනයෙන් යුතුව මුළු ලංකාවටම ආදර්ශමත් ලෙසින්, හොඳ ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක් හැටියට අපට පෙන්වා දෙන්න පුළුවන් කමක් තියෙනවා. අද කාලේ රටේ ලෝකෙ වෙන දේවල් අහනකොට, එතුමිය ගැන විශාල ගෞරවයක් ඇති වෙනවා. ඒ පිළිබඳව අපි ඇත්තටම සතුටු වෙනවා. රාජකාරී කටයුතුවලදී යම් යම් අවස්ථාවලදී අප අතර වචන හුවමාරු වුණා, දොස් පරොස් කතා වුණා. නමුත් අපිත් සමහර නොදන්න දේවල් එතුමියගෙන් අහනවා. අපි දේශපාලකයෝ විදියට දේශපාලන අදහස් දරනවා, දේශපාලන ඉල්ලීම් තමයි කරන්නෙ. එතන නීතිමය පැත්ත අපි බලන්නේ නැහැ. එහෙම කටයුතු කරද්දී නීතිමය පැත්තෙන් මෙතුමියලා, නිලධාරීන් හිර වෙනවා. ඒ අනුව යම් යම් අවස්ථාවල අපි අතර ගැටලුකාරී ප්‍රශ්න ඇතිවෙනවා. නමුත් එතුමිය අපට සැර වෙන්නෙ නැහැ. සමහර අය කියනවා සභාපතිතුමා සමග වැඩ කරන්න බැරුව යනවා ද කියලා දන්නෙත් නැහැ කියලා. මම හිතන්නෙ මගෙන් නම් එහෙම වුනේ නැහැ. නමුත් කොයි දේ වුණත් අපේ ඒ සහෝදරත්වය මග ඇරුන නැහැ. ලේකම්තුමිය, මේ සභාවට එන්න කලින් පොඩි කාලේ ඉඳලම අම්මා තාත්තාගේ ඉඳලම මම ගොඩක් අඳුරනවා. අපේ පවුල් පරිසරය හා එතුමියගේ පවුල් පරිසරය අතර සම්බන්ධතාවක් තිබුණා. එම සම්බන්ධකම් තිබුනත්, පෞද්ගලිකව ඉතා සමීප සම්බන්ධකම් තිබුනත්, අපි මේ සභාව තුළ දී නීතියට අනුව කටයුතු කලා. කොහොම නමුත් සභාවේ කටයුතුවලදී මෙතුමිය නීත්‍යානුකූලව කටයුතු කළ නිසා සමහර අවස්ථා වලදී මන්ත්‍රීවරු තරහ වෙන්නත් ඇති. කොහොම නමුත් දෙයක් වුණොත් ඒ සියලුම දේවල් වලට උත්තර දෙන්න ඕන ලේකම්තුමිය. එහෙම නම් මම මීට වඩා යමක් කියන්න යන්නේ නැහැ. ඔබතුමිය මේ සේවා කාලය තුළ අපට යම් සේවයක් කලා ද, අපි ඒ ගැන ඔබතුමියට කෘතගුණ සළකනවා. ඔබතුමිය යන්නේ දක්ෂිණපාය පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට. මෙම ස්ථානයේ වගේම නව රැකියා ස්ථානයේ කටයුතු සාර්ථකව කිරීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඔබතුමිය යන ප්‍රශ්නය ගැන මම මහ ඇමැතිතුමා සමඟ කතා කල විට , වැරැද්ද කරල තියෙන

ඔබතුමා තමයි කියලා. මොකද, අනුප්‍රාප්තිකයෙක් දීලා එවන්න කියලා ලියුමක් දුන්නෙ ඇයි  කියලා ඇහුවා. ඉතින් එවැනි ලියුම් වලට මම මීට පසු අත්සන් කරන්නෙ නැහැ කියලා හිතාගත්තා. මොකද මම එහෙම අත්සන් නොකරනම්, මෙතුමිය තව අවුරුද්දක් නතර කරගන්න තිබුණා. නමුත් මෙතුමියගේ දැඩි ඉල්ලීම නිසා තමයි මම ලිපිය අත්සන් කලේ. එමෙන්ම පළාත් පාලන ආයතන වල සේවය කරපු නව ලේකම් තුමිය ඇවිල්ල ඉන්නවා. එතුමියගේ මහත්මයා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක තුමා හැටියට සේවය කරලා තියෙනවා. අපි එතුමිය සමඟ ඉතා සුහදත්වයෙන් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අපේ නව ලේකම්තුමියට අවශ්‍ය දැනුම් සම්භාරය ලබා දෙන්න කියලා මම අපේ හිටපු ලේකම්තුමිය ගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වගේම අද හවස දෙකට මුදලිගේ ශාලාවේදී මෙතුමිය වෙනුවෙන් නිලධාරී පිරිස විසින් විශේෂ උත්සව සභාවක් සහ තේ පැන් සංග්‍රහයක් පවත්වන කටයුතු යොදවලා තියෙනවා. ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්  සියලු දෙනා එයට සම්බන්ධ වෙලා සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම කියන්න ඕන මේ සභා පරිශ්‍රයේදී සභාපති කාමරයට ගෙවෙදීම වෙනුවෙන්, 27 රාත්‍රී ගිහි පිරිතක් පැවැත්වෙනවා. 28 පුස්තකාලයේ අලුත් ගොඩනැගිල්ල පාඨක අයිතියට පවරා දෙනවා. ඒ සඳහා උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සහභාගි වෙන්න කියලා ආරාධනා කරනවා.  වෙනත් කරුණු යටතේ කතා කිරීමට අවස්ථාව ලබා දෙමින් මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති එම් කේ ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේ වෙනත් කරුණු යටතේ අපේ සභාපතිතුමා මාතෘකාවක් ඉදිරිපත් කළා. අපේ ලේකම්වරිය වශයෙන් කටයුතු කරපු ෆර්සියා මැතිනිය නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය වශයෙන් කටයුතු කරලා, දකුණු පළාත් කෘෂිකර්ම සහකාර කොමසාරිස් යටතේ සේවය කරන්න ස්ථාන මාරුවක් ලබා ගෙන අපෙන් සමුගන්න අවස්ථාවේදී, එතුමියට සුභ පතන්න මෙය අවස්ථාවක් කරගන්නවා.  මම මේ අවස්ථාවේ අපේ කණ්ඩායමේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් පොදු ස්තුතියක් කරන්න බලාපොරොත්තු වෙනවා. අපි සියලු දෙනාම එකම කරුණ යටතේ මෙම ස්ථානයේ කතා කලොත්, වැඩි වෙලාවක් යනවා. මොකද සවස 2.00 ට කාර්ය මණ්ඩලය හා සුබසාධක සමිතියෙන් එතුමිය වෙනුවෙන් උත්සවයක් සංවිධානය කරලා තියෙනවා. ඒ සඳහා සහභාගී වෙනවා නම්, අපි පුද්ගලිකව හෝ තනි තනිව ස්තුති කළ යුතු වන්නේ නැහැ. මෙතුමියගෙ සේවා කාලය ආරම්භයේ දී සහ අවසානයේ තමයි මම සම්බන්ධ වුණේ. මෙතන ඉන්න සමහර මන්ත්‍රීවරුන් ආරම්භයේ දී මෙතුමිය සමඟ සම්බන්ධ වෙලා කටයුතු කරන්න ඇති. සියලු දෙනා වසරක කාලයක් තුල එනම් එතුමියගේ සේවා කාලයේ අවසන් කාලය තුලදි තමයි එක්ව සම්බන්ධවී කටයුතු කලේ. ගරු සභාපතිතුමා, ලේකම්තුමිය පිළිබඳ කරුණු කාරණා මේ සභාව හමුවේ තැබුවා. අපි මේ අවස්ථාවේ විශේෂයෙන් එතුමියට සුබපතන්නේ, මේ සභාවේ එතුමිය සේවය කළ වසර කිහිපය තුළ නොනගත කාලයක් තමයි වැඩිපුර තිබුණේ. එනම් ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සම්බන්ධ නොවූ කාලය තුළ සිදුකළා වූ කාර්යභාරය, ඒ වගේම සභාවේ පසුගිය අවසාන වර්ෂයේ කළා වූ කාර්යභාරය පිළිබඳවත් අපි විශේෂයෙන්ම එතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳව අඩුපාඩුවක් අපි දකින්නේ නැහැ. සභාවෙ සම්පත් සහ මුදල් පිළිබඳ ප්‍රශ්න වලදී ඊට වඩා දෙයක් බලාපොරොත්තු වෙන්නත් බැහැ. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් මගේ අදහස පිළිගන්නවා ඇති. ඒ වගේම මෙතුමිය මුලින්ම ලේකම්වරියක් වශයෙන් කටයුතු කළේ අපේ සභාවේ. ඊළඟට එන්න ඉන්න ලේකම්වරිය පිළිබඳව අපි සුබවාදීව දකිනවා. මෙතුමියගේ පුද්ගලික ජීවිතයත්, රැකියාවෙත් ඉදිරි අනාගතය දියුණුවෙන් දියුණුවට පත්වේවා. ඒ වගේම මුස්ලිම් භක්තිකයෙක් සභාවේ ප්‍රධාන තනතුරට පත් වුණා. එය සංහිදියාවේ හොඳ ලක්ෂණයක්. තවදුරටත් අපේ වපසරිය තුළ සේවය කරන්න නොලැබීම පිළිබඳව අපි කණගාටු වෙනවා. ඒ වගේම යමක් කියලා කතා කරන්න පුළුවන්,

නිහතමානී අයකු ලෙස, ඔබතුමිය දැක්වූ දක්ෂතාව පිළිබඳව අපේ කණ්ඩායමේ පහලොස් දෙනාගෙම සුබපැතුම් මේ අවස්ථාවේ මම පිරිනමනවා.

ඊළඟට විශේෂයෙන්ම මම ගරු සභාපතිතුමාට මතක් කර සිටිනවා. මේ වන විට උඩලමත්තේ වාඩියගොඩ ප්‍රදේශයේ පොදු නාන ලිඳක් තියෙනවා. ඒක දැන් අබලන් වෙලා, අත්හැරලා දාලා, තියෙන පොදු නාන ලිඳක්. මේ ඉඩම යම් පුද්ගලයෙක් ලබා දුන්නද කියලා මෙහේ සාක්ෂි නැහැ. එය දැනට පිහිටලා තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමියට අයත් දැනට තියෙන රජයේ ඉඩමක. ඒ ඉඩම් කොටස සේවා පියසක් ඉදිකිරීම සඳහා මැනුම් කළා කියලා දැනගන්න ලැබුණා. අපේ ඉඩමේ අයිතිය අපට ලබා ගන්න. භූමි ප්‍රමාණය ඉතුරු කරගන්න, ආරක්ෂා කරගන්න ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරමින්, දැනට මිනුම් කටයුතු සඳහා නියෝග ලබා දුන් ප්‍රාදේශීය ලේකම්තුමියට ඒ බව සිහිපත් කිරීමත්, ඒ වගේම උඩුගම මිනින්දෝරු කාර්යාලයේ අදාළ බලධාරීන් දැනුවත් කරන්න කියලා මේ අවස්ථාවේ මතක් කරමින්, නැවත වාරයක් අපේ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ නායකත්වය ලබා දෙමින් කටයුතු කරපු, හිටපු ලේකම්තුමිය ෆර්සියා මැතිණියට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද, ගරු උප සභාපතිතුමාගෙන්ද, ස්ථාන මාරු වී යන ලේකම්තුමියගෙන්ද, මන්ත්‍රී මණ්ඩලයෙන්ද අවසරයි. එතුමිය අපට සම්බන්ධ වුණේ වසරක් ඇතුළත. ඒ වසර පටන් ගත්ත දවසේ ඉඳලා අවසාන වෙනකොට එතුමිය ස්ථාන මාරු වී යන එක ගැන කනගාටුවක් තියෙනවා. අපිට කටයුතු කරන්න ලැබුනේ අවුරුද්දක් වගේ පොඩි කාලයක්. ඒ අවුරුද්ද ඇතුලත අපි කිසිම බේදයක් නැතුව සහෝදරත්වයෙන් යුතුව කටයුතු කලා. ඒ වගේම අපි මන්ත්‍රී මණ්ඩලයත් සමඟ වැඩ මුළුවකට සහභාගී වුනා. එතනදී ඉතා හොඳ සුහදත්වයෙන් යුතුව කටයුතු කළා. ඒ වගේම අපේ ලේකම්තුමිය නීත්‍යානුකූලව කටයුතු සිදුකළා. උදාහරණයක් විදියට මන්ත්‍රීවරුන්ට ආසන පනවද්දි ගැටලුවක් ඇති නොවෙන්න, ගරුත්වය තියාගෙන ඒ කටයුතු සිදුකළා. ඒ වගේම එතුමිය ස්ථාන මාරු වන්නේ දක්ෂිණපාය කෘෂිකාර්මික නියෝජ්‍ය අධ්‍යක්ෂක කාර්යාලයට. එහිදී මේ නාගොඩ කොට්ඨාශයට කෘෂිකර්මාන්තය පිළිබඳ කටයුතුවලදී ලොකු කැපකිරීමක් අපට ලබාගන්න පුළුවන් වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ඒ කටයුතු වලදී අපට උදව් කරන්න කියලා ඉල්ලා සිටිනවා. එතුමියට නව රැකියා ස්ථානයේ කටයුතු සාර්ථකව සිදු කර ගෙන යාම සඳහා අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. හෙට දිනයේ අපේ සභාවෙන් වෙනත් රැකියා ස්ථානයකට ස්ථාන මාරු වී යන අපේ ලේකම්තුමිය වෙනුවෙන් යම් වචනයක් කථා කිරීම අපේ යුතුකමක් වෙනවා. මොකද විලේගේ සභාපතිතුමා සමඟ සභාවට අපි පත් වූ අවස්ථාවේ අපි දහතුන් දෙනාගේ කණ්ඩායමක් විදියට සිටින අවස්ථාවේ, ලේකම්තුමිය මේ ප්‍රාදේශීය සභාවෙ වැඩ භාරගත්තා. අපේ සභාපතිතුමා, උප සභාපති තුමා, විපක්ෂ නායකතුමා විදිහට මමත් සහභාගී වුන වැඩමුළුවකදී තමයි එතුමිය මුලින්ම දැක්කේ. ඉතින් එදා ඉඳලා අද දක්වාම අපි මන්ත්‍රීවරු විදියට එතුමියත් එක්ක කටයුතු ඉතා සුහදත්වයකින් යුතුව කටයුතු කළා. අපට එතුමියත් එක්ක කටයුතු කරන්න ලැබුණේ ටික කාලයයි. සභාව විසුරුවල තිබෙන අවස්ථාවලදී ප්‍රදේශයේ මහ ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන්, එතුමියගේ පාලන කාලයේ උදව් උපකාර ලබාගන්න අවස්ථාව ලැබුනා. ඇත්තටම කියන්න ඕන. අපේ සියලුම මන්ත්‍රීවරු කතා කළා වගේ ඉතාමත්ම නිහතමානීව එතුමිය එතුමියගේ රැකියාව සිදු කළා. අද මන්ත්‍රී මණ්ඩලය 27 දෙනෙක් ඉන්න වෙලාවෙත් එදා දහතුන් දෙනෙක් ඉන්න අවස්ථාවෙන් ඒ කාගෙවත් හිත රිදවීමක් නොවන ආකාරයෙන් එතුමිය ලේකම් ධූරයේ කටයුතු හොබවලා ඉතාමත් සහයෝගයෙන් අපිත් එක්ක කටයුතු කළා. එතුමිය අපගේ

කටයුතුවලට රාජකාරියමය වශයෙන් ලබාදුන් සහයෝගයට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕන. අපේ සභාපතිතුමා සහ අනිකුත් මන්ත්‍රීවරු කිව්වා වගේ අපි ආගම් දෙකක, ජාති දෙකක වුනාට, ඒ ගැන තැකීමක් නැතුව ඉතාමත් සහෝදරත්වයෙන් වැඩ කරන්න පුළුවන් හැකියාව තියෙන කෙනෙක් විදියට අපි එතුමිය හඳුනගත්තා. විශේෂයෙන්ම මන්ත්‍රීවරු විදියට අපට නෙවෙයි. ප්‍රදේශයට ගියාම, මහජනතාව එතුමිය ගැන ඉතාමත් සුහදත්වයෙන් යුතුව කතා කරනවා. අදාළ කටයුතුවලදී සහයෝගය ලබාදුන් බවත්, ඉතාම නිහතමානීව කටයුතු කරපු කෙනෙක් ලෙසත් සියලුම දෙනා ලේකම්තුමිය ගැන ප්‍රකාශ කරනවා. එතුමියගේ පුද්ගලික අවශ්‍යතාවය මත සහ පහසුව තකා ඇය දක්ෂිණපාය තම සේවා ස්ථානය ලෙස තෝරාගත්තා. එතුමිය බොහොම අමාරුවෙන් මේ සභාව මෙහෙයවලා කටයුතු කරපු කාලෙකුත්, වරප්‍රසාද ලබා කටයුතු කල කාලෙකුත් තිබුණා. ඒ කාල දෙකේදිම එතුමිය කරපු ඒ කටයුතු වෙනුවෙන් අපේ ස්තුතිය මම මේ අවස්ථාවේ ප්‍රදානය කරනවා. එතුමිය යන එක ගැන අපට එක පැත්තකින් ලොකු කණගාටුවක්, අනිත් පැත්තෙන් සතුටකුත් දැනෙනවා. මොකද එතුමිය අපිත් එක්ක මෙතරම් කාලයක් වැඩ කරල අපෙන් වෙන්වී යාම කණගාටුවක්. සතුටට කාරණය තමයි, අපි දන්න කියන කෙනෙක් වෙනත් ආයතනයක සේවය කිරීමේ වාසියකුත් අපට තියෙනවා. මොකද දක්ෂිණපායෙ, පළාත් සභා කෘෂිකර්ම අමාත්‍යංශයේ කටයුතුවලට අපට යන්න අවස්ථා එනවා. එවිට එතුමියගෙ සහයෝගය අප නිරන්තරයෙන් ලබා ගන්න පුළුවන්. ඒ වගේම අපේ ගම් ප්‍රදේශ වලට විශාල සහයෝගයක් එතුමියගෙ අලුත් අනතුර හරහා අපට ලබාගන්න පුළුවන්. ඉතින් ඒ ගැන සතුටු වෙනවා. කොහොම නමුත් එතුමිය නව සේවා ස්ථානයේ කටයුතු සාර්ථකව කරගෙන ගොස් නැවතත් මීටත් වඩා උසස් තනතුරකට පත් වී, අපිත් එක්ක සම්බන්ද වෙන්න අවස්ථාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින්, එතුමියගේ අනාගතයට අපේ සුභපැතුම් එක් කරනවා. ඒ වගේම අලුතින් පත්වෙලා එන ලේකම්තුමිය අපි තවම දැක්කේ නැහැ. මම මේ අවස්ථාවේදී එතුමියත් ගෞරවයෙන් පිළිගන්නවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අපේ තරංග මන්ත්‍රිතුමා කිව්වා වගේ අපි ආගම් කුලමල බේදයක් නැතුව, මේ අවුරුදු 5ක කාලය අපට සේවය කර දුන් අපේ  ලේකම්තුමියට සුභාශිංශන එකතු කරනවා.  එතුමිය අපෙන් සමු අරගෙන යන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට. අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ අපට ඉදිරියේදී එතුමියගෙන් ලොකු සහයෝගයක් ලබා ගන්න පුලුවන් වෙයි. මොකද අපේ අනාගතය තියෙන්නෙ කෘෂිකර්මයත් එක්ක. ඒ වගේම මම තව දෙයක් මතක් කරන්න ඕන. මට මතකයි මීට අවුරුදු තුනකට විතර කලින් අපි තල්ගස්වල ප්‍රදේශයේ පාර හදා දෙන්න කියලා උද්ඝෝෂණයක් කළා. මෙතුමිය ඒ අවස්ථාවේ විජේපාල මහත්මයත් එක්ක එකතුවෙලා අපිට ලක්ෂ 18 ක මුදලක් ලබා දුන්නා. ඒ ගැන මම මේ වෙලාවෙ ස්තුතිය පුද කරනවා. අපට පුදුම ලැදි කමකින් කටයුතු කළ මෙතුමියගේ සියලු කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ඒ වගේම අද දවසේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ වසර පහකට ආසන්න කාලයක් අපිත් එක්ක කටයුතු කර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වෙලා යන අපේ ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, වසර පහකට ආසන්න කාලයක් එතුමිය නාගොඩ ප්‍රාදේශීය සභාවේ කටයුතු ඉතාමත් සාර්ථකව ප්‍රදේශයේ පොදු කටයුතුවලදී, සභාවෙන් කෙරෙන කටයුතුවලදී, එකට එකතුවෙලා එතුමියගෙන් විශාල සහයෝගයක් ලබා ගනිපු මහජන නියෝජිතයකු හැටියට වචනයක් කතා නොකර ඉන්න බැහැ. තරංග මන්ත්‍රීතුමා කියපු විදියට අපි  එක පැත්තකින් කණගාටු වෙනවා. මොකද තව බොහෝ කාලයක්

එතුමියත් එක්ක කටයුතු කරන්න තිබුණා. නමුත් ඔබතුමියගේ පෞද්ගලික අවශ්‍යතාවයන්ගේ පහසුව තකා ඔබතුමිය ස්ථාන මාරු වෙලා යනවා. ඒ වගේම සභාවේ කවුරුත් කතා කළා වගේ, සභාවේ නොනගත කාල සීමාව තුළදී සභාවේ සභාපති, වැනි තනතුරු දරමින් ගැටලුවක් මතු වෙන්න ඉඩ නොදී, සභාව හොඳින් මෙහෙයවලා ඒ පරිපාලන කටයුතු සිදු කළා. ඒ කාලය තුළ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වලදී අපි යම් ඉල්ලීමක් කළා නම්, එතුමිය නොපැකිලව කෙරෙන්න ඕන කටයුත්තක් නම් නීතිමය රාමුව තුළ ඒ සියලු අවකාශයන් අපට ලබා දුන්නා. මම ඒකයි කලින් කිව්වේ මේක ඉතා කණගාටුදායක සිද්ධියක් කියලා. අපට ඉදිරියේදී තව බොහෝ කටයුතු කරන්න තියෙද්දි දක්ෂ නිලධාරිනියක් වෙනත් සේවා ස්ථානයකට මාරු වෙලා යනකොට ඒක ලොකු පාඩුවක්. ඒ වගේම අපි ආගම්වලින් කොටස් දෙකක වුණත්, අපේ සභාවේ සිදු කෙරෙන සියළුම ආගමික වැඩසටහන්වලදී එතුමියගේ දායකත්වය ඉතා හොඳින් ලබා දුන්නා. අපේ ප්‍රදේශයේ ජනතාව අතර ආගමික සංහිඳියාව ඇතිවෙන්න කටයුතු කලා. එක්සත් ජාතික පක්ෂයේ සියළුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් මම මෙතුමියට සුබ පතනවා. මේ රාජ්‍ය යාන්ත්‍රණය තුළ ඔබට බොහෝ දුර ගමනක් යාමට දක්ෂතාවයක් තියෙනවා. අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ රාජ්‍ය තන්ත්‍රයේ ඉහළම තනතුරකට යන්න ඔබතුමියට වාසනාව, ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, නැවත වාරයක් මගේ උණුසුම් සුභපැතුම් එකතු කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමනි, සියලු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, අද දවසේ විශේෂ සභාවට ආරාධනා කළේ අපේ ලේකම්තුමිය ස්ථාන මාරු වී යාම සම්බන්ධයෙන්, එතුමියට සුබ පතන්න. මේ වාරේ එක් අවුරුද්දයි. ඊට කලින් අවුරුදු තුනක් එතුමිය ප්‍රාදේශීය සභාව පාලනය කළා. ඒ පිළිබඳව එතුමියගෙ තක්සේරුවට අනුව එතුමියට සතුටු ඇති. අපිත් යම් මට්ටමකට අසතුටු වෙන සහ සතුටු වෙන තැන් තියෙනවා. ඒ කොහොම නමුත් මෙතුමිය මේ ප්‍රදේශයට ඇවිත් ලොකු සේවාවක් කළා. එතුමියගෙ සංස්කෘතියට අදාල නොවුනත් ප්‍රශ්නයක් ඇති නොවෙන්න කටයුතු කිරීම, හැසිරීම පිළිබඳව සමාජයට කරපු සේවය පිළිබඳව අපි ඇගයීමට ලක්කරනවා.

ඒ වගේම ඒ වගේම පසුගිය ගංවතුර වෙලාවේ, අපේ නියෝජ්‍ය සභාපති සුසන්ත මැතිතුමා කිව්වා වගේ, මේකෙ කවුරුත් හිටියේ නැහැ. එතුමිය තමයි ඒ සියලු පාලන කටයුතු කළේ. මම හිතන්නේ මහ ජනතාවත් එක්ක වැඩ කරන ආයතනයක් විදියට එතුමිය මෙම සේවා ස්ථානයේ සේවය කිරීමෙන් විශාල අත්දැකීමක් ලබාගන්න ඇති. ජනතාවත් එක්ක වැඩ කරන ආයතනයක නොයෙකුත් ගැටළු ඇති වෙනවා. නමුත් අවුරුදු පහක් ප්‍රශ්නයක් නැතුව වැඩ කරලා තමයි අද එතුමිය සමුගන්නේ. ඒක සුවිශේෂයි. ඒ නිසා අපි එතුමියට ගරු කරනවා. ඒ වගේම ජීවිතයේ පළමු වතාවට එතුමියට පොලිසි යන්න සිද්ධ වුණේ මම නිසා. නමුත් මම කළේ හරි දේ. එතුමිය නෙවෙයි. එවකට හිටපු සභාපතිතුමා තමයි වැරැද්ද කලේ. නමුත් රාජකාරියේ දී අන්තිමට නීතියට යටත් වෙන්න සිදු වුනේ එතුමියට. එතනින් එහාට මම ගියේ නැහැ. ඒක මගේ වැරැද්දක් නෙමෙයි කියලා මම අදත් ලේකම්තුමියට කියනවා. ඔබ යන්නාවූ ආයතනයෙන් මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඔබට කරන්න පුළුවන් උදව් සිදු කරයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම නව සේවා ස්ථානයට හොඳ සේවයක් ඉටුකිරීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, අපේ හිටපු ගරු ලේකම්තුමිය ගැන අපි වෙනුවෙන් අපේ උප සභාපතිතුමා කතාකරයි කිව්වා. අපිත් එක්ක බොහොම සුහදශීලීව කටයුතු කළ ලේකම්තුමියට මම බොහොම ස්තුතිවන්ත වෙනවා. අපි මෙතනට ඇවිල්ලා අවුරුද්දක වගේ කාලයක් තුළ තමයි එතුමිය අඳුනගත්තේ. නමුත් ඉස්සෙල්ලා ඉඳලා ජනතාවට සිදු කල සේවය පිලිබඳ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කථා කලා. ඒ නිසා එතුමිය ගැන මම අමුතුවෙන් කතා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපි අදහන ආගමට අනුව ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකක්. ඒ දුක අපට තියෙනවා. ඒක දරාගන්න ආකාරය පිළිබඳව අපේ ආගම දහමේ සඳහන් වෙනවා. ඒ නිසා ඔබතුමියට හොඳ අනාගතයක් වෙන්න කියලා අපි සුබ පතනවා. ඔබතුමිය මෙම ආයතනයෙන් යාම කණගාටුවට කරුණක් වුවත්, ඔබතුමියට ඉදිරි අනාගතයේ හොඳ උසස් තනතුරු වලට යන්න අවස්ථාවක් ලැබේවි. කථා කළ හා කථා නොකල සියළුම මන්ත්‍රීවරුන්ගේ ගෞරවය, ස්තුතිය ඔබතුමිය වෙනුවෙන් ප්‍රකාශ කරමින් මම නිහඬවෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, සියළුම මන්ත්‍රීවරුන්ගෙන්, මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. වසර පහක කාලයක් නාගොඩ ප්‍රාදේශීය සභාවට සේවය ලබා දීලා අද දවසේ නික්මයන ලේකම්තුමිය, අපේ නිලධාරි මහතා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. කතා කරන්න අවශ්‍යතාවය තිබුණා. නමුත් අපේ උප සභාපතිතුමා අපි සියලු දෙනා වෙනුවෙන්ම කතා කරනවයි කියලා ප්‍රකාශ කළා. නමුත් අපටත් ඇත්තටම එතුමියට සුබ පතන්න අවශ්‍යතාවය තිබුණා. ඇත්තටම මම දකින්නේ ලේකම්තුමිය, රාජ්‍ය නිලධාරියෙක් ලෙස කාගෙත් සිත් දිනාගෙන, තමන් කරපු සේවය ඇගයීමට ලක් කරලා යන්න පුළුවන් වෙන්නේ බොහොම අතලොස්සකට පමණයි. ඒ වගේ නිලධාරිනියක් හැටියට ඔබතුමියට අපි සියලු දෙනාම කියන්නේ ඔබතුමිය ගොඩක් හොඳයි කියන එක. ඔබතුමිය මෙම ස්ථානයෙන් නික්ම ගියත්, ඔබතුමියගේ සේවය ඉදිරියේදී අපට ලබාගන්න පුළුවන් වේවි. මොකද අපි ගොවිජන සේවා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සම්බන්ධ වැඩ කටයුතු වලදී, ඒ සේවාව අපට ලබා දෙන්න. ගම් ප්‍රදේශය අමතක කරන්නෙ නැතිව අපට කරපු සේවය ඉදිරියටත් ලබා දෙයි කියන අදහසින්, ඔබතුමිය යන ගමන සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

අද දින විශේෂ සභා රැස්වීමට පැමිණ අදාළ කරුණු යටතේ අදහස් ප්‍රකාශ කර අවසානයේ අද දින විශේෂ සභා රැස්වීම මෙතෙකින් අවසන් කරනවා. විශේෂයෙන්ම, අද පස්වරු 2.00 ට පැවැත්වෙන අපේ සුහද හමුවීමට සියලුම මන්ත්‍රීතුමන්ලාට මන්ත්‍රීතුමියන්ලාට සහභාගි වෙන්න කියලා ආරාධනා කරමින්, පැමිණීම වෙනුවෙන්, සියලු දෙනාටම ස්තුතිය පුද කරනවා. ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමා පැමිණීමට නොහැකිවීම සම්බන්ධයෙන් ෆැක්ස් මගින් දැනුම් දුන් අතර, දිසානායක මැතිතුමා සහභාගී විය නොහැකි බව මට කතා කරලා කිව්වා. එහෙම නම් සියලු දෙනාට බොහොම ස්තුතියි.

සභාපති,

නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී　　　　දිනය:- ..............................